### ශ්‍රී ලංකාව

# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය

2021 සැප්තැම්බර්




**අගෝස්තු 30 වැනි දා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සන්නද්ධ ගැටුම්, වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්, ආපදා, මානුෂවාදී හදිසි අවස්ථා සහ සංක්‍රමණ හේතුවෙන් ලොවපුරා අතුරුදහන් වූ හෝ ඔවුන්ගේ පවුල්වලින් වෙන් වූ තැනැත්තන් දහස් ගණනක් සිහිපත් කළේය. ගෝලීය වශයෙන්, වර්තමානයේ අතුරුදහන් වූ තැනැත්තන් ලෙස 210,000 ට වැඩි පිරිසක් රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ පවුල් සබඳතා ජාලය විසින් ලියාපදිංචි කර ඇත. එම ජාලය ඔවුන් පවුල් සමඟ යළි එක්කිරීමට උපකාර කරයි.**

1983 සිට 2009 දක්වා ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම පැවති කාලය තුළදී තම ඥාතීන් අතුරුදහන්ව ඇති පවුල්වලින් ඔවුන් සොයාගැනීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට දළ වශයෙන් ඉල්ලීම් 35,000 ක් ලැබිණ. දැනට විසඳීමට අවශ්‍ය ඉල්ලීම් 15,000 කට වැඩි සංඛ්‍යාවක් අප සතුව ඇති අතර ඒවායින් සමහරක් 1990 පමණ කාලයේදී ලැබී ඇත. මෙම සංඛ්‍යාවන් පසුපස ඇත්තේ අතුරුදහන් වූ තැනැත්තන් ගේ පවුල්වල දුක් පීඩා වන අතර එම පවුල් තම ප්‍රියාදරයන් කොහේ සිටිත්දැයි හෝ ඔවුනට අත්වූ ඉරණම පිළිබඳව නොදැන සංතාපයෙන් සහ අවිනිශ්චිතතාවයෙන් දිගටම කල්ගෙවති.

“ඔවුන්ගේ ප්‍රියාදරයන් අමතක නොකරන බව අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට ඒත්තු ගැන්වීමට අපට අවශ්‍යව ඇත. ඔවුන් තනිවී නැති අතර මෙම පවුල්වලට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය පිළිගනිමින් ඔවුන්ට පිළිතුරු ලබාදීම පිණිස රාජ්‍යයන්ට තමන්ට ඇති බලය යටතේ  සෑම දෙයක්ම ඉටුකිරීමට අපි අඛණ්ඩව ආධාර කරමු.” ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල් රොබට් මාදිනි පැවසීය.

ශ්‍රී ලංකාවේ, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ක්‍රියාත්මක කරන දිපව්‍යාප්ත සහායක වැඩසටහන මගින් අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල මනෝසමාජීය, ආර්ථික, නෛතික සහ පරිපාලන අවශ්‍යතා ආමන්ත්‍රණය කෙරෙන අතර ඔවුන්ගේ ප්‍රියාදරයන් කොහේ සිටිත්දැයි යන ප්‍රශ්නයට  පිළිතුරු සපයන යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා ක්‍රියාකරයි.

# බන්ධනාගාරවල කෝවිඩ්-19 ප්‍රතිචාරයට ආධාර කිරීම




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අත්වැසුම්, ගවුම් හා උඩකබායන්, මුහුණු ආවරණ, ඇස් ආවරණ, මුව ආවරණ, සායනික හිස්වැසුම් සහ නිර්-ස්පර්ශ උෂ්ණත්වමාන ඇතුළු පුද්ගල ආරක්ෂක උපකරණ, පවිත්‍රතා සහ විෂබීජ නාශක ද්‍රව්‍ය සහ පුද්ගල සනීපාරක්ෂක ද්‍රව්‍ය පරිත්‍යාග කරමින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවට සහ අධිකරණ අමාත්‍යාංශයට අඛණ්ඩව ඔවුන්ගේ බන්ධනාගාරවල කෝවිඩ්-19 ප්‍රතිචාරයට ආධාර සපයයි. මෙම ද්‍රව්‍ය සහ උපකරණ කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ, ගාල්ල බන්ධනාගාරයේ, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ සහ මීගමුව බන්ධනාගාරයේ දී ප්‍රයෝජනය පිණිස යොදා ගනු ලැබේ.

# මහර බන්ධනාගාරයේ අලුත්වැඩියා කිරීම්




2020 නොවැම්බර් මාසයේ මහර බන්ධනාගාරයේ ඇතිවූ කැරැල්ලේදී හානි සිදුවූ එහි රෝහල අලුත්වැඩියා කිරීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉදිකිරීම් ද්‍රව්‍ය පරිත්‍යාග කළේය. මෙම ද්‍රව්‍ය 2017 දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් ඉදිකරන ලද වාට්ටු තුනක් අලුත්වැඩියා කිරීමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට යොදා ගනු ලැබේ. බන්ධනාගාර අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ මූලික වශයෙන් රැඳවියන් විසින් ඉටුකරනු ලබන මෙම අලුත්වැඩියා කිරීම් 2022 වසර ආරම්භයේදී නිමකිරීමට අපේක්ෂා කෙරේ. මෙම අලුත්වැඩියා කිරීමෙන් රැඳවියන් 1,700 කට වැඩි පිරිසකට ප්‍රතිලාභ අත්වෙයි.

# ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ස්වාභාවික පරිසරය රැකගැනීම




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකයන් පුහුණුකිරීමේ ආයතනයේ සහයෝගයෙන් "ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ස්වාභාවික පරිසරය රැකගැනීම: වැළැක්වීමේ ප්‍රතිචාරයක්" මැයෙන් අන්තර්ජාලය ඔස්සේ පවත්වන සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය. 2020 දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් පළ කරන ලද සන්නද්ධ ගැටුම්වලදී ස්වාභාවික පරිසරය ආරක්ෂාකිරීම පිළිබඳ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම සැලකිල්ලට ගනිමින් ස්වාභාවික පරිසරය ආරක්ෂා කරන ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් මෙම සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදී. ඊට සහභාගිවූ නීති ක්ෂේත්‍රයේ ශාස්ත්‍රඥයන් සහ සන්නද්ධ හමුදාවල විශේෂඥයෝ සඵලදායි නිවාරක ප්‍රතිචාරයක් සකස්කරගැනීමේදී ජාතික නීත සම්පාදනයේ, ප්‍රතිපත්තිවල සහ හමුදා ක්‍රියාමාර්ග භූමිකාව ගැන සාකච්ඡා කළහ. මෙහිදී කථිකයෝ ගැළපුම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම, අදාළ නියෝජ්‍යායතන සමඟ සම්බන්ධිකරණය සහ මෙම විෂය පිළිබඳ අවබෝධය ව්‍යාප්තකිරීම යන කරුණුවලදී ජාතික ජාත්‍යන්තර මානුෂවාදී නීති කමිටුවේ භූමිකාව කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගනිමින් සන්නද්ධ ගැටුම් පවතින අවස්ථාවලදී පරිසරය සුරැකීමට පවතින දේශීය නෛතික ප්‍රතිචාරය ගැන සාකච්ඡා කළහ.

# පවුල් සබඳතා යළි ස්ථාපනය කිරීමේ වැඩසටහනේ අවශ්‍යතා තක්සේරුව




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ එක්ව පවුල් සබඳතා යළි ස්ථාපනය කිරීමේ වැඩසටහනේ අවශ්‍යතා තක්සේරුවක් දිපව්‍යාප්තව ක්‍රියාත්මක කරමින් සිටී. මෙම තක්සේරුවේ අරමුණවන්නේ ජාතික සමාජය සතු අතුරුදහන් තැනැත්තන් සොයාගැනීමේ ධාරිතාව පුළුල්කිරීම සහ එවන් සේවාවන් සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. මාස හයක් පමණ කාලයක් තුළ සිදුකෙරෙන මෙම තක්සේරුවෙන් සොයාගන්නා කරුණුවලින් මෙම සංවිධාන දෙකට මනා අවබෝධයක් ලබාගැනීමට සහ සංක්‍රමණිකයන්ට, විදේශිකයන්ට සහ ස්වාභාවික ආපදාවලින් බලපෑමට ලක්වූවන්ට උපකාර කිරීමට හැකිවෙයි.

# ආගමික සහ මානුෂවාදී ප්‍රතිපත්තිවල අභිසරණය: ක්‍රිස්තියානි ආගම සහ හින්දු ආගම පිළිබඳ පර්යේෂණ පුළුල් කිරීම




ගතවූ වසර කිහිපය තුළ, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බුදුදහමේ සහ මානුෂවාදී නීතියේ සංකලනය ගවේෂණය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ බෞද්ධ ශාස්ත්‍රඥයන්ගේ කවයන් සමඟ සබඳතා පිහිටුවා ගෙන ඇත. මෙවැනි පර්යේෂණ සහ සංවාද උදෙසා ක්‍රිස්තියානි සහ හින්දු විද්‍යාර්ථීන් සමඟ ද ජාල ගතවීමට ප්‍රයත්න දරනු ලැබේ. ලංකා දේවධර්ම විද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය පිළිබඳ අංශයේ විද්‍යාර්ථීන් සමඟ මාර්ගගත ක්‍රමයට විස්තර කිරීමක් සිදුකරන ලදී. ආගම සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ තවදුරටත් අධ්‍යයන පර්යේෂණ පැවැත්වීමේ මාර්ග සොයාබැලීම සම්බන්ධයෙන් අපි ප්‍රමුඛ හින්දු විද්‍යාර්ථී සහ දේශක කම්බවාරිති ඉලංකායි ජෙයරාජ් මහතා ද හමුවීමු.

# එක්ව සිටින අප නැවැත්විය නොහැකිය: ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය සැමරීම




රතු කුරුස සහ රතු අඩසඳ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයෝ සෑම දිනකම ලොවපුරා ප්‍රජාවන් වෙනුවෙන් වෙනසක් ඉටු කරති. වසංගතය විසින් මතු කරනලද අතිරේක අභියෝග පැවතියත් ප්‍රජාවන් උදෙසා සේවය කිරීමේ ඔවුන්ගේ අධිෂ්ඨානය අගය කරමින්, “එක්ව සිටින අප නැවැත්විය නොහැකිය” යන තේමාව යටතේ මැයි 08 වැනිදා ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය සමරන ලදී.

එම දිනය සනිටුහන් කරමින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සභාපති පීටර් මවුර පැවසුවේ, “සමහරවිට තම ආරක්ෂාව පරදුවට තබා, රතු කුරුස සහ රතු අඩසඳ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයෝ සෑම අර්බුදයකදීම ඉදිරි පෙළෙහි සිටිති. ඔව්හු ඉතාම නරක තත්වයන්හිදී, සන්නද්ධ ගැටුම්වලදී සහ වෙනත් මානුෂවාදී අර්බුදවලදී මානව දුක් වේදනා වැළැක්වීමට සහ පිටුදැකීමට ප්‍රජාවන් සමඟ, ප්‍රජාවන් උදෙසා මහත් සේවයක් කරති. ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය ඔවුන්ට උපහාර පිදීමට අපට ලැබෙන අවස්ථාවයි: සෑම දිනකම ලොවපුරා ප්‍රජාවන් වෙනුවෙන් වෙනසක් ඉටු කරන ඔවුහු කිසිවෙකු අත්නොහරින බවට වගබලා ගනිති.”

මේ වසරේදී ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ හවුල්කරුවෝ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 හි අඩු ආදායම්ලාභී පවුල්වලින් තෝරා ගත් සිසුන් 50 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහනක් දියත් කිරීමට ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ සම්බන්ධ වූහ. මෙම දිගුකාලීන වැඩසටහනින් එම සිසුන්ට ඔවුන් අධ්‍යාපනය අවසන් කරන තුරු මාසික දීමනාවක් ගෙවනු ලැබේ. ශිෂ්‍යත්ව පිරිනැමීම ජාතික සමාජයේ කොළඹ ශාඛාවේදී ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ සභාපති ජගත් අබේසිංහ මහතාගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය “අහිමි ලොව ප්‍රතිෂ්ඨාපනය කරමු” වැඩසටහන යටතේ පාසල් දරුවන්ගේ පරිසර මිතුරු චර්යාව ප්‍රවර්ධනය පිණිස දිස්ත්‍රික්ක 25 ක් තුළ පැළ 250 ක් පමණ රෝපනය කළේය.

ස්වේච්ඡා සේවකයන්ට ගෞරව දැක්වීමේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ ජාතික සමාජයේ කෝවිඩ්-19 ඒකාබද්ධ ප්‍රතිචාරය ගැන විස්තර අඩංගු වීඩියෝවක් නිකුත් කළ අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි සේවාවන් ඔස්සේ ගුවන් විදුලි වැඩසටහනක් විකාශනය කරන ලදී. ඉන් අනතුරුව ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් ගුවන් ගත කෙරිණ.

ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනයේදී රතු කුරුස ව්‍යාපාරයේ නිර්මාතෘ මෙන්ම ප්‍රථම සම නොබෙල් සාම ත්‍යාගලාභියා වන හෙන්රි ඩුනාන්ට් ගේ ජන්ම දිනය සැමරෙයි. ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ මෙහෙවර ඉටුකිරීමට ලොව පුරා කැපවී සිටින ස්වේච්ඡා සේවකයන් සංඛ්‍යාව මිලියන 14 ක් පමණ වෙයි.

# තොරතුරු සහ දත්ත විස්තර

## (මැයි - අගෝස්තු 2021)

### අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

- තැනැත්තන් සොයාගැනීම පිණිස කළ විමසීම්වල පසුවිපරම් සඳහා පවුල් 5 ක් හමු වූ අතර නව සිද්ධි 3 ක් ලියාපදිංචි කරන ලදී
- අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් 701 දෙනෙකු සතිපතා මනෝසමාජීය ආධාර සැසිවලට සම්බන්ධ වූ අතර ඔවුන්ගෙන් 87 දෙනෙක් ආර්ථික, නෛතික හා පරිපාලන, අධ්‍යාපන සහ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා ආධාර ලබාගැනීම පිණිස අවශ්‍ය සම්පත් ස්ථාන කරා යොමු කරනු ලැබූහ
- ජීවනෝපායක් උපයාගැනීමට ආධාර වශයෙන් පවුල් 105 කට මුදල් ප්‍රදාන සපයන ලදී
- අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් 22 කට ආසන්නතම අවශ්‍යතා (ආහාර සහ වෙනත් අත්‍යවශ්‍ය වියදම්) සපුරා ගැනීමට බහුකාර්ය මුදල් ප්‍රදාන සැපයිය
- අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් ඇතුළු, ගෘහ 300 යක කෝවිඩ්-19 හි බලපෑම පිළිබඳ ආර්ථික සුරක්ෂිතතා බහු නිරීක්ෂණ සමීක්ෂණය

---

### රැඳවුම් තත්වයන් නිරීක්ෂණය

- 1 රැඳවුම් මධ්‍යස්ථානයක එක් චාරිකාවක් සිදුකිරීම
- රැඳවියන් 28 දෙනෙකු හමුවී සොයාගත් කරුණු සහ නිර්දේශ සංක්‍රමණ බලධාරීන් සමඟ රහසිගතව හුවමාරු කරගැනීම

- රැඳවුම් ස්ථාන 10 ක රැඳවියන් 5,432 දෙනෙකුට අත්වැසුම් 18,200 ක්, ගවුම් හා උඩකබායන් 2,750 ක්, මුහුණු ආවරණ 1,500 ක්, ඇස් ආවරණ 325 ක්, FFP2 මුව ආවරණ 3,500 ක්, සායනික හිස්වැසුම් 5,500 ක් සායනික මුව ආවරණ 12,300 ක් සහ නිර්-ස්පර්ශ උෂ්ණත්වමාන 20 ක් ඇතුළු සනීපාරක්‍ෂක ද්‍රව්‍ය සහ පුද්ගල ආරක්‍ෂක උපකරණ, බන්ධනාගාර සෞඛ්‍ය සේවා නිලධාරීන් වෙත සපයන ලදී

- බන්ධනාගාර බලධාරීන් දෙදෙනෙකු වෙත රතු කුරුස පණිවුඩ 3 ක් (පවුල් තොරතුරු සැකෙවින් අන්තර්ගත) බාරදීම

- අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවියන් 200 දෙනෙකු වෙනුවෙන් වීඩියෝ චාරිකා කාමර වැඩිදියුණු කිරීම

- මුව ආවරණ 5,000 ක් නිපදවීමට බන්ධනාගාර මූලස්ථානයට අමු ද්‍රව්‍ය බාරදීම

- මහර බන්ධනාගාරයේ රෝහල අලුත්වැඩියා කිරීමට ඉදිකිරීම් ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම, මෙයින් රැඳවියන් 1,700 කට ප්‍රතිලාභ අත්වෙයි

- නව මැගසින් බන්ධනාගාරයේ ගබඩා කාමරයක් අලුත්වැඩියා කිරීමට සහ එහි ගැස් සම්බන්ධතාවය පිහිටුවීම පිණිස ඉදිකිරීම් ද්‍රව්‍ය සපයන ලද අතර රැඳවියන් 1,200 කට පමණ ඉන් ප්‍රතිලාභ අත්වෙයි

- වැලිසර තාවකාලික ආගමණික මධ්‍යස්ථානයේ බාහිර විවේක ප්‍රදේශය ආවරණ කරන ලද අතර සංක්‍රමණිකයන් 150 කට පමණ ඉන් ප්‍රතිලාභ අත්වෙයි

---

## මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම

- ලංකා දේවධර්ම විද්‍යාලයේ ක්‍රිස්තියානි විද්‍යාර්ථීන් 14 ක් සහ යාපනය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය පිළිබඳ අංශය සහ කතෝලික විද්‍යාර්ථීන් 14 ක් සමඟ ආගම සහ මානුෂවාදී ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉටුකරන කාර්යයන් ගැන මාර්ගගත විස්තර කිරීමක් සිදුකරන ලදී. ජූලි 02 දා, මාර්ගගත පසුවිපරම් රැස්වීමක් ලංකා දේවධර්ම විද්‍යාලය සමඟ පැවැත්විය

- ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ පිනිවාහි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ මානව හිමිකම් පිළිබඳ විද්‍යායතනය විසින් ශාස්ත්‍රඥයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙනුවෙන් මැයි මාසයේ සිට ජූනි දක්වා මාර්ගගත ලෙස පවත්වන ලද 14 වැනි උසස් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා යුදහමුදාවට අනුයුක්ත නීති නිලධාරියෙක් සහභාගිවිය

- හින්දු සමාජ සමඟ ජාලගතවීම සහ හින්දු ආගම සහ මානුෂවාදී නීතියේ අභිසරණය ගවේෂණය කිරීම පිණිස ජූලි 28 දින කීර්තිමත් හින්දු විද්‍යාර්ථිකයෙකු වන කම්බවාරිති ඉලංකායි ජෙයරාජ් මහතා හමුවිය

- බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකයන් පුහුණුකිරීමේ ආයතනයේ සහයෝගයෙන් අගෝස්තු 31 දා “ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ස්වාභාවික පරිසරය රැකගැනීම” මැයෙන් අන්තර් ජාලය ඔස්සේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. දේශකයන්ට ශ්‍රාස්ත්‍රාල, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයෝ ඇතුළත්වූහ

---

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර කිරීම

- ශාඛාවල ආපදා ප්‍රතිචාර ශිල්පක්‍රම සම්බන්ධයෙන් ස්වේච්ඡා සේවකයෝ 64 දෙනෙක් පුහුණු කරනු ලැබූහ
- ශ්‍රී ලංකා රතු කුරුස සමාජය පැවැත්වූ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු පාඨමාලාවට ප්‍රථමාධාර උපදේශකයෝ 25 දෙනෙක් සහභාගිවූහ
- මානුෂවාදී ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානය පිළිබඳ සැසි 07 ක් සංවිධානය කරනු ලැබීය
- ශිෂ්‍යත්ව වැඩසටහනක්, පැල සිටුවීමේ වැඩසටහනක්, ගුවන් විදුලි ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සහ ඒකාබද්ධ කෝවිඩ්-19 ප්‍රතිචාරය පිළිබඳ වීඩියෝව දියත් කරමින් ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය සැමරීය
- මෝසම් වැසි කාලය සඳහා හදිසි තොගයක් පවත්වාගැනීම පිණිස තුවා 1,400 ක්, ඇඳ ඇතිරිලි 1,400 ක් සහ හකුලන මෙට්ට 375 ක් මිලදී ගැනීමට අරමුදල් සැපයීය
- කෝවිඩ්-19 තුන්වැනි රැල්ලට ප්‍රතිචාර දැක්වීමට ජාතික සමාජයට අත්වැසුම් 2,500 ක්, මුහුණු ආවරණ 3,500 ක්, උඩකබායන් 2,800 ක් සහ සායනික මුව ආවරණ 85,000 ක් සඳහා මූල්‍යාධාර සපයන ලදී
- කෝවිඩ්-19 පැතිරීම වැළැක්වීම සහ පාලනය පිණිස දිස්ත්‍රික්ක 6 ක (කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ සහ පුත්තලම) පොදු ස්ථාන 488 ක විෂබීජහරණය කෙරිණ
- දිස්ත්‍රික්ක 10 ක (අනුරාධපුරය, මඩකලපුව, හම්බන්තොට, මහනුවර, කිලිනොච්චිය, මාතර, නුවරඑළිය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ වව්නියාව) සම්මුඛ සාකච්ඡා 128 ක් පවත්වමින් පවුල් සබඳතා යළි ස්ථාපනය කිරීමේ වැඩසටහනේ අවශ්‍යතා තක්සේරුවක්


**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර,කොතුකුලම්,
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc


ICRC

© ICRC, October 2021

1708/259 10.2021
ඔටකවර ඡායාරූපය: ICRC